කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
விவசாயத் திணைக்களம்
DEPARTMENT OF AGRICULTURE

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය
பீடைகொல்லி பதிவு அலுவலகம்
Office of the Registrar of Pesticides

අංක 1056, ගැටඹේ, තැ.පෙ. 49, පේරාදෙණිය 20400, ශ්‍රී ලංකාව
இல 1056, கெடம்பே, த.பெ.இல 49, பேராதனை 20400, இலங்கை
No. 1056, Getambe, P.O. Box 49, Peradeniya 20400, Sri Lanka

දුරකථන/தொலைபேசி/Telephone : (94)812388076/388135
ෆැක්ස්/தொலைநகல்/Fax : (94)812388135
ඊ මේල්/மின்னஞ்சல்/E-mail : pest@slt.lk
වෙබ්/மின்னஞ்சல்/Web : www.doa.gov.lk

මගේ අංකය / எனது எண் / My No: RP/VIII/A1

ඔබේ අංකය / உமது எண் / Your No:

දිනය / திகதி / Date: 2019.03.25

**චක්‍රලේඛ අංක: RP/AUO/2019-2**

අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු)

පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්
(මධ්‍යම, වයඹ, උතුරුමැද, නැගෙනහිර, ඌව, සබරගමුව, උතුර, දකුණ, බස්නාහිර)

අධ්‍යක්ෂ (කෘෂිකර්ම), ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

**පළිබෝධනාශක අලෙවි යාන්ත්‍රණය ක්‍රමවත් කිරීම:**
**ඉදිරි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ගනු ලැබ ඇති තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ මාගේ 2018.02.15 දිනැති චක්‍රලේඛ අංක: RP/AUO/2018-1 මගින් අවධාරණයට ලක්කරන ලද ශ්‍රී ලංකාවේ පළිබෝධනාශක අලෙවි යාන්ත්‍රණය නිසි ක්‍රමවත්භාවයක් සහිතව පවත්වා ගැනීම සඳහා පවතින නෛතික රාමුව තුළ සිදු කරන ලද සහ සිදු කළ හැකිව ඇති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඔබගේ කාරුණික අවධානය යොමු කිරීම මෙම චක්‍රලේඛයේ අරමුණයි.

02. 1994 අංක 06 හා 2011 අංක 31 දරණ පනත් මගින් සංශෝධිත 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 24අ. (1) වන උප වගන්තිය මගින් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වශයෙන් මා වෙත පැවරා ඇති බලතලවලට අනුව, සෞඛ්‍ය අමාත්‍යංශය යටතේ අනුයුක්ත ආහාර සහ ඖෂධ පරීක්ෂකවරුන් 41 දෙනෙකු සහ දිස්ත්‍රික් ප්‍රධාන පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 10 දෙනෙකු සඳහා පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ වූ වැරදි සඳහා නඩු පැවරීමට හා නඩු කටයුතු මෙහෙයවීමට බලය පවරා ඇති බව සතුටින් දැනුම් දෙමි. උක්ත පනතේ 24 අ. (2) උප වගන්තියට අනුව මෙම නිලධාරීවරුන් වෙත උක්ත පනත යටතේ සිදු කළ හැකි කාර්ය සහ කර්තව්‍යයන් අතර–

(අ) පළිබෝධනාශක ඇසුරුම් උක්ත පනතේ විධිවිධානවලට (14 වන වගන්තිය) අනුකූලව සිදුකර තිබේ ද යන වග; සහ

(ආ) යම් තැනැත්තෙකු විසින් 16 වන වගන්තියේ විධිවිධාන (ආහාර දූෂණය වන ආකාරයෙන් පළිබෝධනාශක පරිහරණය) උල්ලංඝනය කර ඇත්තේ ද යන වග; සහ

(ඇ) සෑම වෙළෙන්දෙකු විසින්ම පළිබෝධනාශක විකිණීම සඳහා සහතිකයක් ලබාගෙන තිබේද යන වග (21අ. (1) උප වගන්තිය);

නිසැකවම දැනගැනීමට, නඩු පැවරීමට හා නඩු කටයුතු මෙහෙයවීමට බලය ඇත. එක් එක් පළාත් නියෝජනය වන පරිදි මුළු දිවයිනම ආවරණය වන පරිදි නම් කරන ලද ආහාර සහ ඖෂධ

පරීක්ෂකවරුන් සහ දිස්ත්‍රික් පරිපාලන ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 51 දෙනෙකුගේ නාමලේඛණයක් මේ සමග අමුණා එවමි.

03. වර්ෂ 1994 අංක 06 දරණ පනතින් සංශෝධිත වර්ෂ 1980 අංක 33 දරණ පලිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 5(1) (ආ) වගන්තියට අනුව ක්ෂෙත්‍ර නියාමන කටයුතු කාර්‍යක්ෂම කිරීම සහ ප්‍රගති සමාලෝචන කාර්‍යය සඳහා උපකමිටුවක් පිහිටුවීම සම්බන්ධ 2018.12.18 දින පැවති පළමු රැස්වීමේ දී සියළුම පලිබෝධනාශක බලයලත් නිලධාරීවරුන් සඳහා නිසි මාර්ගෝපදේශ සහ අවශ්‍ය කාර්‍ය සාධන ඉලක්ක ලබා දී කාර්‍යක්ෂම පලිබෝධනාශක අලෙවි යාන්ත්‍රණයක් ඇතිකිරීම සඳහා අන්තර්පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්, පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් (මධ්‍යම, වයඹ, උතුරුමැද, නැගෙනහිර, ඌව, සබරගමුව, උතුර, දකුණ, බස්නාහිර) සහ අධ්‍යක්ෂ (කෘෂිකර්ම), ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යන අංශ නියෝජනය වන පරිදි සාමූහික එකඟතාවයක් ඇති කර ගන්නා ලදි. මේ සම්බන්ධයෙන් 2019.03.02 පැවති කෘෂිකර්ම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ද අවධාරණය කරනු ලැබ ඊට අවශ්‍ය එකඟතාවය ලැබී ඇත.

04. මේ අතර, මාගේ 2018.02.15 දිනැති චක්‍රලේඛ අංක: RP/AUO/2018-1 මගින් අවධාරණයට ලක් කරන ලද පරිදි පලිබෝධනාශක අලෙවිසැල් සඳහා අලෙවි සහතික නිකුත් කිරීමේ දුර්වල ප්‍රගතිය තවදුරටත් පවතින තත්ත්වයක් මම නිරීක්ෂණය කරමි. දිවයින තුළ 2018 වර්ෂයේ දී අලෙවිසැල් 1057 ක් සඳහා බලපත්‍ර ලබා ඇති බව දිපව්‍යාප්ත බලයලත් නිලධාරීවරුන්ගේ ප්‍රගති වාර්තා පෙන්වා දී ඇත (කරුණාකර පහත සඳහන් වගුව බලන්න). මෙම සංඛ්‍යාව 2016 වර්ෂය සඳහා සමාන කාල සීමාවක් තුළ නිකුත් කරන ලද බලපත්‍ර 1461 ක් වූ සංඛ්‍යාව සමග සැලකූ කල ලබා ඇති ප්‍රගතිය තවදුරටත් පහළ මට්ටමක පවතින බව පෙන්වා දෙමි. මේ දක්වා මෙම කාර්යාලයට වාර්තා කර ඇති දිවයින තුළ පවත්වා ගෙන යනු ලබන පලිබෝධනාශක අලෙවිසැල් 2294 ක් අතුරින් බලපත්‍ර ලබා දී ඇත්තේ සියයට 46 ක පමණ ප්‍රගතියකින් බව තවදුරටත් පැහැදිලි වේ. මේ අතර, මෙම පහළ කාර්‍ය සාධනය සහ සමහර දිස්ත්‍රික්ක හා මහවැලි බල ප්‍රදේශ තුළ පවත්වා ගෙන යනු ලබන පලිබෝධනාශක අලෙවිසැල් පිළිබඳ තොරතුරු ලබාදීමට බලයලත් නිලධාරීවරුන් කටයුතු නොකිරීම පිළිබඳව ද විගණන විමර්ශණවල දී අවධානයට යොමු වී ඇති බව නැවත වරක් අවධාරණයෙන් යුක්තව සඳහන් කරමි.

05. දිවයින තුළ ක්‍රියාත්මක පලිබෝධනාශක අලෙවිසැල් සියල්ලම අනිවාර්‍යයෙන්ම පලිබෝධනාශක අලෙවි සහතිකයක බලය යටතේ අලෙවිය සිදු කළ යුතු අතර, එකී පනතේ 21(අ) වන වගන්තියට අනුව අලෙවි බලපත්‍ර ලබාදීම නිසි විමර්ශණයකින් පසුව ප්‍රදේශය භාර බලයලත් නිලධාරීවරයා විසින් සිදු කළ යුතු කාර්‍යය කි. එබැවින්, මෙම කාර්‍යය ඉටුකිරීම කෙරෙහි එකී පනත යටතේ නම් කර ඇති සියළුම බලයලත් නිලධාරීවරුන් ව්‍යවස්ථානුකූල වගකීමට බැඳී සිටින බව අවධාරණය කරමි. මෙම කාර්‍යය කාර්‍යක්ෂම කිරීම සහ අවශ්‍ය පරීක්ෂණ/විමර්ශණ සිදු කිරීම සඳහා එක් එක් ප්‍රදේශය භාර බලයලත් නිලධාරීවරුන් යටතේ අවශ්‍ය යැයි හැඟෙන කෘෂිකර්ම උපදේශකවරුන් යම් සංඛ්‍යාවක් නම් කර එවීමෙන් පසුව උක්ත පනත යටතේ වූ වැරදි සඳහා නඩු පැවරීමට සහ නඩු කටයුතු මෙහෙයවීමට බලයලත් නැනැත්තන් වශයෙන් නම් කළ හැකි ය. එබැවින්, මේ යටතේ දැනටමත් නම් කර ඇති කෘෂිකර්ම උපදේශකවරුන් හැර සෙසු නවක කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා අවශ්‍ය නෛතික බලය ලබාදීමට සුදුසු නිර්දේශ මා වෙත එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි .

06. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ අනුයුක්ත ආහාර සහ ඖෂධ පරීක්ෂකවරුන් සහ දිස්ත්‍රික් පරිපාලන ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් ඉතා සද්භාවයෙන් යුතුව උක්ත පනත යටතේ වූ වැරදි සඳහා නඩු පැවරීමට සහ නඩු කටයුතු මෙහෙයවීමට සක්‍රිය

සහභාගිත්වයක් ලබා දීමට මූලික සාකච්ඡාවල දී එකගතාවය පළකර ඇති හෙයින් එහි නිසි ඵල ප්‍රයෝජන සියළුම බලයලත් නිලධාරීවරුන් ලබාගනු ඇති බව විශ්වාස කරමි. ඒ සඳහා අවශ්‍ය නිසි සම්බන්ධීකරණය ඇති කිරීම උදෙසා පළාත් මට්ටමින් බලයලත් නිලධාරීවරුන් සහ නඩු පැවරීමට සහ නඩු කටයුතු මෙහෙයවීමට බලයලත් නිලධාරී හමු පැවැත්වීම සුදුසු බව යෝජනා කරන අතර ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

07. උක්ත පනත යටතේ වූ වැරදි සඳහා නඩු පැවරීමට සහ නඩු කටයුතු මෙහෙයවීමට බලයලත් තැනැත්තන් වශයෙන් නම් කර ඇති කෘෂිකර්ම උපදේශකවරුන් සම්බන්ධයෙන් පෙර ක්‍රියාත්මක ක්‍රමවේදය පරිදි ප්‍රදේශයේ පළිබෝධනාශක බලයලත් නිලධාරියා, උක්ත නිලධාරීන්ගේ ද සම්බන්ධීකරණ නිලධාරියා ලෙස කටයුතු කළ යුතු වේ.

08. මෙම චක්‍රලේඛයෙන් දක්වා ඇති ඉදිරි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ගනු ලැබ ඇති තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගේ ප්‍රමුඛ අවධානය යොමු කරන ලෙසත් පවතින නීති ප්‍රතිපාදන උල්ලංඝනය නො වන පරිදි අවශ්‍ය කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීම කෙරෙහි කාරුණික අවධානය යොමු කරන ලෙසත් උදක් ම බලාපොරොත්තු වෙමි.

ආචාර්ය ජේ.ඒ. සුමිත්
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්

පිටපත්:

1. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් – කා.දෑ.ස.
2. නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (පාරිසරික සහ වෘත්තීය සෞඛ්‍ය සහ ආහාර ස්වස්ථතා) – කා.දෑ.ස.
3. අධ්‍යක්ෂ (බී.ස.පැ.සං.) – කා.දෑ.ස.
4. සියළුම දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් – කා.දෑ.ස.
5. අභ්‍යන්තර විගණක – කා.දෑ.ස.
6. එස්.එන්.එල්. රත්නවීර මහතා (ස.කෘ.අ.) – කා.දෑ.ස. අවශ්‍ය සම්බන්ධීකරණය සහ පසුවිපරම් සිදුකිරීම සඳහා